

# ලෝකාලෝකය

## 2018 සැප්තැම්බර් - නොවැම්බර් කලාපය

**වෙහෙසවෙන්නාවූ, බරඋසුලන්නාවූ සියල්ලෙනි,**
**මා වෙතට එන්න, මම නුඹලාට සහනය දෙමි**
**(මතෙව් 11:28)**


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901

ළමා පිටුව

# හොඳ ළමයෙක්.

ආදර දුවේ පුතේ, මම ඔයාලට කියල දෙන්න යන්නේ බයිබලයේ සඳහන් වන හරිම අපූරු පුංචි යාළුවෙක් ගැන. මෙයාගේ නම නම් බයිබලයේ සඳහන් වෙන්නේ නැහැ. එයා පිරිමි ළමයෙක්ද, ගැහැණු ළමයෙක්ද කියලා සඳහන් වෙන්නෙත් නැහැ. නමුත් හරිම අපූරු ක්‍රියාවක් කළ හොඳ ළමයෙක්. කැමැතියි නේද දැනගන්න ඒ මොකක්ද කියලා.

ශුද්ධ බයිබලයේ, අලුත් ගිවිසුමේ යොහාන් 6 වන පරිච්ඡේදයේදී තමයි මෙයාව හමුවෙන්නේ. අනෙක් අලුත් ගිවිසුම් පොත්වලත් මේ සිදුවීම ගැන සඳහන් වෙනවා. යේසුස්වහන්සේ කන්දකට නැග තමන් ගෝලයන් සමඟ සිටින විට උන්වහන්සේ ළඟට බොහෝ සෙනඟ ඇවිත් රැස්වුණා. උන්වහන්සේ ඔවුන්ට උගන්වා, සුවය අවශ්‍ය අයට සුවය ලබා දුන්නා **(ලූක් 9:11)**. වේලාව ගත වී සවස් කාලය ළං වෙන්නට පටන් ගත්තා. එවිට ගෝලයන් දොළොස්දෙනා යේසුස්වහන්සේ ළඟට ඇවිත් **"සමූහයා ගම්වලට ගොස් තමන්ට කෑම මිලදී ගන්න ලෙස ඔවුන් යන්ට හරින්න"** යැයි යේසුස්වහන්සේට කිව්වා **(ලූක් 9:12).** එවිට යේසුස්වහන්සේ පිලිප් කියන ගෝලයාගෙන් මෙසේ ඇසුවා. " මොවුන්ට කන්න දෙන්න අපි කොතනින් රොටි මිලේට ගන්නද?" "එක්කෙනෙකුට ටික ටිකවත් ලැබෙන්නට මසු දෙසියක රොටිත් මදි" යැයි කියා පිලිප් පිළිතුරු දුන්නා. (මසු - එහෙමත් නැත්තම් "මස්ස" කියලා කියන්නේ යේසුස්වහන්සේගේ කාලයේ භාවිත කළ මුදල් ඒකකයට. හරියට අපි රුපියල් ශත භාවිතා කරනවා වගේ).

මේ අතරේ පේතෘස් සහ අන්ද්‍රෑ කියන ගෝලයන් දෙදෙනට හමුවුණා තමන් ළඟ රොටි පහයි මාළු දෙදෙනෙකුයි ඇති ළමයෙක්. මේ ළමයා මේ කෑම ටික යේසුස්වහන්සේට දුන්නා. යේසුස්වහන්සේ මේ රොටි පහ සහ මාළු දෙදෙනාගෙන් පන්දහසකටත් වඩා දෙනෙකුට ඇතිවෙන්න කෑම දුන්නා. හරිම පුදුමයි නේද දුවේ, පුතේ?

ඒ විතරක් නෙමෙයි ඉතිරි වුන කෑම වලින් කූඩ දොළහක් පුරවා ගත්තා. හැමෝටම හරිම සතුටු සිතෙන්න ඇතිනේද? දුවේ පුතේ යේසුස්වහන්සේට තමන්ගේ කෑම ටික දුන්න ළමයා ගැන මොහොතකට සිතන්න.

පළමුවෙන්ම මේ ළමයා යේසුස්වහන්සේව බලන්න ආවා. සමහරවිට එයාගේ දෙමව්පියන් එක්ක එන්න ඇති. බලන්න මෙයා යේසුස්වහන්සේව බලන්න හරිම ආසාවෙන් එන්න ඇති නේද? ඒවගේම උන්වහන්සේ උගන්වන දේවල් හරිම ආසාවෙන් අහගෙන ඉඳලා තියෙනවා. ඒකනේ එයාගේ කෑම එකවත් හවස් වෙනකල්ම කාලා තිබුනේ නැත්තේ. ඔයාලත් ගමන් බිමන් යනකොට ඔයාගෙ අම්මත් ඔයාට කෑම පෙට්ටියකුයි, වතුර බෝතලයකුයි දෙනවා නේද?

ඒ වගේම, මේ ළමයා එයාගේ කෑම ටික යේසුස්වහන්සේට දෙන්න කැමති වුණා. ඒත් මෙයා කවදාවත්ම හිතන්න නැතුව ඇති එයාගේ කෑම ටිකෙන් යේසුස්වහන්සේ පන්දහසකට කන්න දෙයි කියලා. නමුත් තම ආහාරය අනෙක් අය සමඟ බෙදා ගන්න කැමති වුණා. මේ ළමයා ගොඩක් සතුටු වෙන්න ඇති නේද එයාගේ පොඩි කෑම ටිකෙන් බොහෝ දෙනෙක් කෑම කනවිට. ඉතින් දුවේ පුතේ, පුංචි ඔයාලට මේ යාළුවගේ ක්‍රියාවෙන් ඉගෙන ගන්න පුළුවන් පාඩම් මොනවාද? ඔව්. පළමුවෙනි එක තමයි යේසුස්වහන්සේට ඇහුම්කන්දීම. ඒ කොහොමද? දිනපතාම බයිබලය කියවා යාච්ඤා කිරීම තුලින්. දෙවැනි එක තමයි බෙදා හදා ගැනීම. ඔබ ළඟ තිබෙන දේවල් අනිත් අය සමඟ බෙදා ගැනීමෙන්. ආහාර, ඇඳුම් පැළඳුම්, සෙල්ලම්බඩු, පොත්පත්ම විතරක් නොවෙයි. ඔබේ දැනුමත් ඔබට බෙදා ගන්නට පුළුවන්. ඉතින් පුංචි ඔයාලත් මේ ළමයා වාගේ අනෙක් අය ඉදිරියේ දෙවියන්වහන්සේව ගෞරවයට පත් කරන්න.

යේසුපිහිටයි.
මීට, ආදර
**- ශෂිලා නැන්දා -**

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය.

## ★ දෙවියන්වහන්සේගේ සේවය තුළ යේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය.

**"උන්වහන්සේ (යේසුස්වහන්සේ) දෙවියන්ව හන්සේගේ රූපාකාරය දරන සේක්, දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගනම සිටිය යුතු වූ වස්තුවක් යැයි නොසිතා, එය ඉවත්කර දාසයකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණිසේක" (පිලිප්පි 2:6-7).**

ඉහත පදයේ "දාසයකුගේ ස්වරූපය" යන්නෙහි අර්ථය අපට පැහැදිලිය. යේසුස්වහන්සේ මාංශවත් වූයේ දෙවියන් වහන්සේ මේ පොලොවේදී වඩාත් උතුම් සේවයක් කරන පිණිසය. **"මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්ට ආවේය" (මතෙව් 20:28 / මාර්ක් 10:45).** ඉන්පසු උන්වහන්සේ ජීවිතය දීම නැමති උතුම් පූජාවද ඉටු කරනු ලැබූ සේක. අවුරුදු 33 1/2 ක්ම සියයට සියයක් මනුෂ්‍යයකු ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මිහිමත තම සේවය මනුෂ්‍යයන් වෙනුවෙන් ඉටු කළ සේක. ඉන් උන්වහන්සේගේ



ජීවිතයේ අවසාන අවුරුදු 3 1/2 තුල කළ සේවය ඉතාමත් ආකර්ෂණීයයි, එමෙන්ම බලයෙන් හා යාච්ඤාවෙන් පූර්ණයි.

**උන්වහන්සේගේ සේවයේ කැපී පෙනෙන ගුණාංග.**

1. යාච්ඤාවෙන් පූර්ණ සේවය.
2. බලයෙන් පූර්ණ සේවය.
3. යටහත්කමින් පූර්ණ සේවය. (නිහතමානීභාවය)
4. අනුග්‍රහයෙන් පූර්ණ සේවය.
5. දේව වචනයෙන් පූර්ණ සේවය.

## 1. ස්වාමී වූ යේසුස්වහන්සේගේ සේවය යාච්ඤාවෙන් පූර්ණය.

උන්වහන්සේ කළ සේවය දෙස අපි සුභාරංචි පොත් වලින් බැලූ විට නිතර යාච්ඤා කළ බව දැකගන්නට හැකිය. සේවයේ කැපී පෙනෙන ලක්ෂණය බවට පත් වන්නේ දෙව් පියාණන්වහන්සේ මත යැපීමයි. එනම් නිතර ඉල්ලීම් හා කන්නලව්වෙන් පියාණන්වහන්සේගේ කැමැත්ත හා මුහුණ සෙවීමයි.

**"උන්වහන්සේ මාංසවත්ව සිටි දවස්වලදී තමන්වහන්සේ මරණයෙන් ගලවන්ට පුළුවන් වූ තැනැන්වහන්සේට බලවත් හැඬීමෙන් හා කඳුලින් යුක්තව යාච්ඤා හා කන්නලව් ඔප්පුකර තමන්ගේ දේවභය නිසා උත්තර ලැබ.." (හෙබ්‍රෙව් 5:7).**

දේව පුත්‍රයාණන් මෙසේ යාච්ඤාවෙන් සේවයට අවශ්‍ය අනුග්‍රහය දෙවියන්වහන්සේගෙන් ලබා ගත්තෙහි නම් අප වර්තමානයේ සේවය කිරීම උදෙසා කෙතරම් කන්නලව්වෙන් හා යාච්ඤාවෙන් ගත කළ යුතු වේද?

උන්වහන්සේ යාච්ඤා කළ අවස්ථා.

★ ලූක් 3: 21
උන්වහන්සේ බව්තීස්මය ලැබූ අවස්ථාවේ.

★ ලූක් 5:16
උන්වහන්සේ වනාන්තරයට ගොස් තනියම යාච්ඤා කිරීම.

★ ලූක් 6:12
උන්වහන්සේ කන්දට ගොස් මුළු රාත්‍රියම යාච්ඤා කළ සේක.

★ ලූක් 9:18
උන්වහන්සේ තනියම යාච්ඤා කළ සේක.

★ ලූක් 9:28
උන්වහන්සේ ගෝලයන් සමග යාච්ඤා කළ සේක.

★ ලූක් 11:1
උන්වහන්සේ තවත් තැනක යාච්ඤා කළ සේක.

★ ලූක් 22:44
උන්වහන්සේ වේදනාවේදී යාච්ඤා කළ සේක.

★ ලූක් 22:46
උන්වහන්සේ පරීක්ෂාවේදී යාච්ඤා කළ සේක.

★ ලූක් 23:34-46
උන්වහන්සේ මරණ මංචකයේදී යාච්ඤා කළ සේක.

## 2. ස්වාමී වූ යේසුස්වහන්සේගේ බලයෙන් පූර්ණ සේවය.

යේසුස්වහන්සේ සේවය කරන විට උන්වහන්සේ තුලින් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශණය විය.

★ මතෙව් 8:27 / 14:25 ...
ස්වභාව ධර්මය අභිබවා යන බලය.

★ මතෙව් 4:24
සියලු රෝග අභිබවා යන බලය.

★ යොහාන් 3:8 / මතෙව් 9:32
යක්ෂයාගේ බලය අභිබවා යන බලය.

★ මතෙව් 9:6
පාපය කමා කිරීමේ බලය.

★ යොහාන් 11:43
මරණය අභිබවා යන බලය.

★ මතෙව් 28:19
සියලු බලය අභිබවා යන බලය.

## 3. ස්වාමී වූ යේසුස්වහන්සේගේ යටහත් පහත්කමින් (නිහතමානී) පූර්ණ සේවය.

**"මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින් මාගෙන් ඉගෙන ගනිල්ලා" (මතෙව් 11:29).** උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ලෙස සියලු බලය ඇතිව සිටියත් උන්වහන්සේගේ සේවය පුරාවට යටහත්පහත්ව හා නිහතමානීව තම සේවය මිහිමත ඉටු කළ සේක. එය ශ්‍රේෂ්ඨ හා උතුම් සේවයකි.

★ මතෙව් 3:13-17
යොහාන් බෞතීස්තට බෞතීස්ම කිරීමට ඉඩ දීම.

★ යොහාන් 13:3-5
ගෝලයන්ගේ පාද සේදීම.

★ මතෙව් 17:24-27
ආණ්ඩුවට බදු ගෙවීම.

★ ලූක් 19:5-7
පව්කාරයෙක්ව සිටි සාකෙවුස් වැනි මනුෂ්‍යයන්ගේ ගෙදර ගොස් කෑමට සිටීම.

★ ලූක් 18:15-16
දරුවන් ළඟට ගෙන ආශිර්වාද කිරීම.

★ ලූක් 23:9
පිලාත් ඉදිරිපිට නිෂ්ශබ්දව සිටීම.
★ මතෙව් 12:16 / මතෙව් 10:20
තමන් ක්‍රිස්තුස්වහන්සේ බව කිසිවෙකුට නොකියන්ට ගෝලයන්ට අණ කිරීම.

සුභාරංචි පොත් ඉතා ප්‍රවේශමෙන් කියවන විට උන්වහන්සේගේ යටහත් පහත් නිහතමානී සේවය පිළිබඳ අවස්ථා බොහෝමයක් අපට දැන හඳුනාගැනීමට හැකිය.

## 4. යේසුස්වහන්සේගේ අනුග්‍රහයෙන් පූර්ණ සේවය.

කිසිවෙකු ප්‍රතික්ෂේප නොකිරීම, සුළු නොකිරීම, වරදට පත් නොකිරීම උන්වහන්සේගේ සේවයේ දක්නට ලැබෙන ශ්‍රේෂ්ඨත්වයයි.

★ යොහාන් 4:1-20
සමාරිය ස්ත්‍රිය පිළිගැනීම.
★ යොහාන් 8:11
කාමමිත්‍යාචාරය කර හසු වූ ස්ත්‍රිය වරදට පත් නොකිරීම.
★ මතෙව් 8:3-4
කුෂ්ඨ රෝගී මත අත තබා සුව කිරීම.
★ මතෙව් 14:13-16 / 15:32-34
පන්දහසකට හා හාරදහසකට කෑම දීම.
★ මතෙව් 26:69-75
තුන් වතාවක් උන්වහන්සේ හඳුනන්නේ නැත කියූ පේත්‍රුස්ට සමාව දීම.
★ ලූක් 22:47-51
උත්තම පූජකයාගේ සේවකයා වූ මල්කස්ගේ කපා දැමූ කන සුව කිරීම.

★ ලූක් 23:39-43
තම කුරුසියේ වම් පැත්තේ සිටි පසුතැවිලි වූ සොරාට සමාව දීම.

## 5. දේව වචනයෙන් පූර්ණ සේවය.

ස්වාමී වූ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ වචනය (පරණ ගිවිසුමේ වචන) සෑම විට උපුටා දක්වමින් තම සේවය ඉටු කළසේක.

★ මතෙව් 4:1-11
යක්ෂයා තමන් පරීක්ෂාවට පත් කිරීමට පැමිණිවිට.
★ මතෙව් 13:10-10
ගෝලයන්ට ඉගැන්වීමේදී.
★ මතෙව් 15:20
විරුද්ධවාදීන් නිශ්ශබ්ද කරන පිණිස.
★ මතෙව් 21:42-43
ගෝලයන් ධෛර්යමත් කිරීම පිණිස.
★ මතෙව් 22:41-46
ඵරිසිවරුන්ට අවබෝධකර දෙන පිණිස.
★ මාර්ක් 7:5-7
ගෝලයන් ආරක්ෂා කර ගැනීම පිණිස.
★ මාර්ක් 12:35-37
තම දිව්‍යභාවය ඔප්පු කිරීම පිණිස.

මේ ආකාරයට ස්වාමී වූ යේසුස්වහන්සේ තම සේවය ඉටු කිරීමෙහිලා පරණ ගිවිසුම් දේව වචන උපුටා දක්වමින් ශ්‍රේෂ්ඨ උතුම් සේවයක් ඉටු කළ සේක. උන්වහන්සේ සේවය කළ පිළිවෙල අද අපත් ආදර්ශයක් කොට ගැනීම බොහෝ ප්‍රයෝජනවත්ය.

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**

# රොටි කැඩීමේ රැස්වීම.
# (ස්වාමීන්වහන්සේගේ රාත්‍රී භෝජනය)
## (1 කොරින්ති 11:23-31)

## රොටි කැඩීමේ මෙහෙය යනු...

★ සභා චාරිත්‍රයක් නොවේ.

★ කිතුණු පුරුද්දක්ද නොවේ.

★ භෞතික ආශිර්වාද ලැබෙන ක්‍රියාවක්ද නොවේ.

★ පාරම්පරික පැවත එන ක්‍රියාවක්ද නොවේ.

★ නොකර සිටිය යුතු ක්‍රියාවක් ද නොවේ.



## 01. කීකරුවීමේ ක්‍රියාවකි.

**"මා සිහිකිරීම පිණිස මේක කරපල්ලා" (ලූක් 22:19)**

★ උන්වහන්සේගේ වචනයට (අණට) කීකරුවීමකි.

★ උන්වහන්සේගේ අධිකාරිත්වයට (ස්වාමීකත්වයට) කීකරු වීම නොහොත් ප්‍රතිචාර දැක්වීමයි. ඒ මඟින් රොටි කැඩීමේ මෙහෙය තුලදී කීකරුවීමේ ප්‍රීතිය අත්දැකීමට හැකිය.

අප අපගේ පාපවලින් නිදහස් වූයේ යේසුස්වහන්සේගේ උත්තරීතර ජීවිත පූජාව තුලින් පමණක් බව අප සිහිකිරීම තුලින් අපට උන්වහන්සේගේ අණට හා අධිකාරීත්වයට කීකරුවීම පෙන්නුම් කරයි. එවිට ඒ මඟින් ප්‍රීතිය අත්දැකිය හැක.

## 02. භක්තිවන්තකමේ ක්‍රියාවකි.

**"නුඹලා උදෙසා දෙන්නාවූ මාගේ ශරීරයය..." "නුඹලා උදෙසා වගුරුවන මාගේ ලේය" (ලූක් 22:19-20).**

★ අපගේ හදවතේ හැඟීම් කුමක්ද? එය අනිවාර්යෙන් යෙසුස්වහන්සේ කෙරෙහි භක්තිවන්ත ප්‍රේමණීය හැඟීමක් විය යුතුය. මක්නිසාදයත් අප උදෙසා ජීවිතයම උන්වහන්සේ දුන් සේක. වද වින්ද සේක. තවත් බොහෝ දුක්වින්ද සේක.

මේ පිළිබඳ අප සිහිකරන විට අපගේ හදවතේ උන්වහන්සේ පිළිබඳ භක්ති ආදරය වැඩි වේ. "මා උදෙසා" මේ සියල්ලම ඉටු කළ බව සිතීම තුලින් උන්වහන්සේ සමඟ මාගේ බැඳීම් ශක්තිමත් වේ. එවිට උන්වහන්සේ සමඟ අන්නෝන්‍යය බැඳීම පිළිබඳ ප්‍රීතිය අත්දැකිය හැක.

## 03. අදාල කර ගැනීමේ ක්‍රියාවකි.

★ ප්‍රේමය වැඩ සිද්ධ කරයි.- 1 කොරින්ති 8:1

★ ප්‍රේමය පරිත්‍යාගශීලීය. - යොහාන් 3:16

★ අනුග්‍රහයෙන් ගැලවීම ලැබීම. - එපීස 2:8

යේසුස්වහන්සේගේ කරුණා අනුග්‍රහය අපට අදාල කර ගනිමින් එම අනුග්‍රහය කරණා කොට ගෙන මගේ ජීවිතයේ සිදුවූ ගැලවීම

සිහිකිරීමකි. එමගින් අපට උන්වහන්සේගේ සෑහෙන අනුග්‍රහය භුක්තිවිදින අතර සැහීමකට පත්වීමේ ප්‍රිතිය අත්දැකිය හැක. අපට යේසුස්වහන්සේ පමණක් සෑහේ.

## 04. අගය කිරීමේ ක්‍රියාවකි. (ප්‍රශංසා කිරීම)

**"අලුත් ගිවිසුමේ ලේය. - ලූක් 22:20"**
**"නුඹලා උදෙසා වගුරුවන මාගේ ලේය"**

★ ලෙයෙහි අලුත් ගිම්සුම - (ලූක් 22:20) අලුත් ගිවිසුමේ සහතිකභාවය පිළිබඳ දෙවියන්වහන්සේට අපගේ ස්තූතිවන්ත කම පල කිරීමට තිබෙන අවස්ථාවකි.
★ යේසුස්වහන්සේගේ දේවත්වය පිළිගැනීම හා අවබෝධ කරගැනීමත් එය කරණකොට ගෙන නමස්කාර කිරීමේ ප්‍රීතිය අපට අත්දැකිය හැක.
★ රොටි කැඩීමේ මෙහෙයට සහභාගී වීම යනු හදවතේ ගැඹුරු නමස්කාරය යේසුස්වහන්සේට පිළිගැන්වීමයි.

## 05. උන්වහන්සේ සමඟ ඒකත්වයට පැමිණීමේ ක්‍රියාවකි.

"කන්න, බොන්න, කරන්න"
★ මේ මඟින් උන්වහන්සේ මරණය, වැලලීම හා නැවත නැගිටීම සමඟ අප ඒකත්වයට පත් වෙයි.
★ රොටි කඩන සෑම වාරයක් පාසාම මෙම ක්‍රියාවලිය සිදු වෙයි.
★ එහි ප්‍රතිඵලය වන්නේ යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ බලය හා ජයග්‍රහණය අපගේ ජීවිතය තුළ ක්‍රියාත්මක වීමයි. එහි ප්‍රතිඵලය වන්නේ යේසුස්වහන්සේ සමඟ සහභාගීකම් පැවැත්වීමේ ප්‍රිතිය භුක්තිවිදීමට ලැබීමයි. විශේෂයෙන් උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය කරණකොටගෙන අප චින්තාත්මය අලුත් වීමයි.

## 06. අපේක්ෂාව අලුත් කරන ක්‍රියාවකි.

**"ස්වාමින්වහන්සේ එනතුරු මරණය ප්‍රකාශ කරන්නහුය".**

ස්වාමින්වහන්සේගේ මේසයට සහභාගී වීම උන්වහන්සේගේ දෙවැනි පැමිණීමේ පොරොන්දුව අලුත් කර ගනියි. එනම් එහි ප්‍රතිඵලය වන්නේ බලාපොරොත්තුව පිළිබඳ ප්‍රිතිය අපිට අත්දැකීමට හැකිවීමයි. යේසුස්වහන්සේ උන්වහන්සේ අදහාගත් අය රැගෙන යාමට නැවත පැමිණෙන බවට පොරොන්දු වී ඇත. රොටි කැඩීමේ මේසය ළඟද එම පොරොන්දුව සිහිකරන අතර ඒ මඟින් "ඇදහිලිවන්තයාගේ තේජාන්විත අපේක්ෂාව තුළ මහත් ප්‍රීතියක් භුක්තිවිදිය හැක"

## 07. ස්වයං - සොදිසි කර ගැනීමේ ක්‍රියාවකි.

"තම තමාම සොදිසි කොට කෑවාවේ බීවාවේ" මෙහිදි මම මාගේ ජීවිතය දෙස බලයි. දේව වචනයේ ආලෝකයෙන් හා ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකිරීමෙන් හා මඟපෙන්වීමෙන් ජීවිතය සොදිසි කර ගැනීමට අවස්ථාවක් ලැබේ. මගේ පාප මටම මතක් වෙන අතර ඒ ගැන පසුතැවිලි වී හදවතේ ගැඹුරින් ස්වාමින්වහන්සේට පාපය කියා දිය යුතුය. සමාව අයද සිටිය යුතුය. එවිට නැවත අප ආත්මික ජීවිතය හා උන්වහන්සේ සමඟ තිබෙන සම්බන්ධතාවය අලුත් වෙයි. නැවත නැවත අලුත් වීමේ ප්‍රිතිය අත්දැකිය හැක.

**- එස්. මෙත්තානන්ද -**

# කවුද බොස්?



කුඹල් මාමාගේ වළංකඩේ අද හරිම කලබලයක්. තමන් අතරෙන් කව්ද ප්‍රධානියා වෙන්නේ කියලා මැටි භාජන අතරේ ලොකු වාදයක්. ලස්සන මල් පෝච්චියක් ආඩම්බරකම් පෙන්වමින් කියනවා, "මම තමයි මිනිසුන් අතර හොඳ තැනක ඉන්නේ. ඒ අයගේ ගෙවල් ලස්සන කරන්නේ මමයි. ඉතින් මමයි මෙතැන ප්‍රධානියා වෙන්න ඕනෑ".

ඔන්න එතකොට ගුරුලේත්තුවක් කියනවා, "ඔය මල් පොච්චියෙන් මිනිසුන්ට වතුර බොන්න පුළුවන්ද? මම තමයි මිනිසුන්ගේ තිබහ නිවන්නෙ. මමයි මෙතැන ප්‍රධානියා වෙන්න ඕනෑ".

එවිට හැලියට කේන්ති ගිහින් මෙහෙම කියනවා, "ඔහේගේ වතුර බිබී මිනිසුන්ට හැමදාම සිටිතෑකිද? මමයි ඒ අයට බත් උයලා දෙන්නේ මම නැත්තම් ඒ අය බඩගින්නේ මැරිලා යාවී. මමයි ප්‍රධානකමට සුදුස්සා".

ඒ ගමන කැටය පෙරලි පෙරලි ඇවිත් කියනවා, "සල්ලි ඉතුරු කරගත්තෙ නැත්නම් මිනිසුන්ට අනාගතයක් නෑ. මම සල්ලි පුරවාගෙන ඉන්න තරමට ඒ අයට හොඳයි. මම වැදගත් සේවයක් කරන්නේ. මමයි මුල් තැනට සුදුස්සා".

කළයටත් හොඳටම කේන්ති ගිහිං, "මගේ අගේ දන්නේ නැතිවයි. ඔහේලා ඔය විදිහට කථා කරන්නේ. මම යන්නේ එන්නේ කාන්තාවන්ගේ උකුලෙන්මයි. මං නැත්නම් ගෙවල් වලට වතුර ගේන්න බෑ. මමයි ප්‍රධානියා".

වාදය දිගටම කෙරුණා. මේ අතර මහා සුළං කුණාටුවක් හමන්න පටන් ගත්තා. පොල් අතු වලින් සාදපු කුඹල් මාමාගේ කඩෙත් සෙලවෙන්න පටන් ගත්තා. කුණාටුව තව තවත් සැරවුණා. එකපාරටම කඩේ ඇලවුණා. රාක්කවල තිබූ මැටි භාජන ඔක්කොම බිම පෙරලුනා. ඔක්කොම කෑලි වලට කැඩිලා බිඳිලා ගියා. දැන් මල්පොච්චියයි, ගුරුලේත්තුවයි, හැලියයි, කැටයයි ඔක්කොම එකවාගේ, නිකම්ම වළංකටු ගොඩක් විතරයි.

මේ අතර බිම මුල්ලක ඉඳල මැටි ගුලියක් මෙහෙම කතාවක් කීවා,"ප්‍රධානියා වෙන්න හැදුවට ඔයගොල්ලන්ට හොඳ පාඩම. ඉස්සර ඔයගොල්ලන් ඔක්කොම මං වගේ මැටි ගුලියක් කියන එක අමතක වුණා නේද? ප්‍රධානියා අපි කවුරුත්ම නෙවෙයි. අපිව එක එක විදියට සාදන කුඹල් මාමා විතරයි මෙතැන ප්‍රධානියා".

මේ කතාවෙන් අපි හැම දෙනාටම ඉගෙන ගන්න හොඳ පාඩමක් තියෙනවා අපි ඔක්කොම දෙවියන්වහන්සේගේ අතේ මැටි ගුලියක් වගේ යයි ශුද්ධවූ බයිබලයේ සඳහන් වෙනවා. (යෙරමියා 18:6) එක එක භාජනයට එක එක සේවයක් තියෙනවා. දෙවියන්වහන්සේ අපට සුදුසුම සේවයටයි අපව පත්කරන්නේ, ඒත් හැම සේවයක්ම යේසුස්වහන්සේ තුළ එක සමානයි. තරාතිරම් බැලීමක් නෑ. උයනගෙයි අම්මත් සභාවේ ප්‍රධානියත් යේසුස්වහන්සේ තුළ එක සමානයි. අපව මනින්නේ ප්‍රේමයේ කෝදුවෙන් මිස සේවයේ තරාතිරමෙන් නොවෙයි. ඉතින් කවදාවත්ම තව කෙනෙක්ව පහත් කරලා කතා කරන්න එපා. තමන්ම උසස් කරගන්න හදන්න එපා. මුළු ගෞරවයම යේසුස්වහන්සේට දෙන්න පුංචි කාලේ සිටන්ම පුරුදු වෙන්න.

**(පැරණි ලෝකාලෝක සඟරාවකින් උපුටා ගැනීමකි)**

# යහපත් - යෙහෝෂාපාත් රජ



"ස්වාමීන්වහන්සේ විනිශ්චයකාරයාණෝය" යන හෙබ්‍රෙව් නාමාරුතිය ලත් "යෙහොෂාපාත්" රජු පිළිබඳව ආහබ් රජුගේ විස්තර විවරණයේදී අපි සඳහන් කළෙමු. (ඔහු දුෂ්ඨ රජෙක්වූ ආහබ් රජුගේ විස්තර විවරණයේදී අපි සඳහන් කළෙමු), ඔහු දුෂ්ඨ රජෙක්වූ ආහබ් සමඟ සිරියවරුන්ට විරුද්ධව එක්සිත්ව සටන් කිරීමට සහය වූ අයුරු ඔබට මතක ඇත. යෙහෝෂාපාත්ගේ පියාණන්වූයේ යුදාහී කීර්තිමත් රජු ලෙස වසර හතලිස් එකක් රජ කම්කළ (**1 රාජාවලිය 15:10**) ආසාය. ඔහුගේ රාජ්‍ය පාලනය දේව කරුණාවෙන් සඵලවිය. ආසාගේ මරණින් පසු යුදා දේශයේ රාජ්‍ය නායකයා ලෙස යෙහෝෂාපාත් සිංහාසනාරූඪ විය. අවුරුදු තිස්පහක් වැනි දීප්තිමත් යෞවන වියකදී කිරුළු පැළැඳි ඔහු යෙරුසෙලමේ විසිපස් අවුරුද්දක් රජකම් කළේය. අසූබා ඔහුගේ මව් බිසව වූවාය. ක්‍රිස්තු පූර්ව 870 පමණෝදී රජුබවට පත් යෙහෝෂාපාත් පිළිබඳ දීර්ඝ විස්තර 2 ලේකම් 17 පර්ච්ඡේදයේ සිට 20 පරිච්ඡේදය දක්වාත් 1 රාජාවලිය 22 පරිච්ඡේදය මුළුල්ලේත් අපට උගත හැක.

මෙම විරෝධාර රජුගේ පාලන සමයෙහි ඔහුට අද්නා, නම් යුද්ධයෙහි වික්‍රමාන්විතයෙක් සිටියේය. අද්නා සෙනෙවියා යටතෙහිවූ සේනාංකයෙහි සටන් දක්ෂයන් ලක්ෂ තුනක් වූහ. යෙහෝහානාන් තවත් සෙනෙවියෙකි. දෙලක්ෂ අසූදාහක ප්‍රබල හමුදාවක් ඔහු යටතේ වූහ. අමාසියා නම් සෙනවියාගේ අණසකට යටත් හමුදාවේ දෙලක්ෂයක් වූහ. එළියාදා සෙනවියා යටතෙහිවූ දුනුවායන් හා පලිස්දරන්නන් දෙලක්ෂයකි. යෙහෝසාබාද් සෙනෙවියා යටතෙහි වූ එක්ලක්ෂ අසූදහසක් රජුට මෙහෙකල සේනාවත් සමඟ ගණනය කලවිට එකොලොස්ලක්ෂ හැට දහසක බල ඇණි පහක් යෙහෝෂාපාත්ට උරුම විය.

## ප්‍රබල සේනාංක

මේ සේනාවෙන් නිසිඵල නෙලා ගත්, "**යෙහෝෂාපාත් අතිශයින් උතුම්ව යුදාහි බලකොටුද ගබඩා නුවරවල්ද ගොඩ නැඟීය" (2 ලේකම් 17:12).** මේ අයුරින් ස්වකීය රාජ්‍ය බලය තහවුරු කර ගත් රජු අවට රාජ්‍යයන්ට මහත් භීතියක් විය. ඊශ්‍රායෙල් - යුද පිරිස් වල සතුරන් වූ පිලිස්තියන් ගෙන් ඇතැමෙකු රිදී හා වෙනත් තෑගිද බැටළුවන් හත්දහස් හත්සියයක්ද එළුවන් හත්දහස් හත්සියයක්ද රජුට කප්පම් වශයෙන් ගෙනා බව **2 ලේකම් 17:11** දක්වයි. වත්මන් යුද්ධ බලඇණි මට්ටමින් වුවද සැලකූ විට යෙහෝෂාපාත් සතුව තිබූ යුද බලය එකලද ඉතාම විශිෂ්ඨ බැව් පෙනේ. දාවිත්, සාවුල්, වැනි ආදිමය රජවරුන්ට මහත් හිසරදයක් වූ පිලිස්තියයන් පවා යෙහෝෂාපාත්ට යටත් වීමෙන් ඔහු ලද නිදහසත් යුදා වරුන් ලැබූ සමාදානයත් අධික බවට සැක නැත. **හිතෝපදේශ 22:5** යෙහෝෂාපාත් අත්දුටු සත්‍යයකි. එය අපටද පොදු ධර්මතාවයකි. **"යටත්කමේදී ස්වාමින්වහන්සේ කෙරෙහි භය වීමේදී විපාකය නම් වස්තුවත්, ගෞරවයත් ජීවිතයත්ය"** ඔබම මෙය අත්හදා බලන්නේ නම් මැනවි.

## සමලිංගිකයන් වනසා

යෙහෝෂාපාත් යුදාහී රජකම් කිරීම ඇරඹූයේ එම රාජ්‍යයේ සිව් වැනි රජු

වශයෙනි. ඒ වනවිට ඊශ්‍රායෙල්හි රජුව සිටියේ ආහබ්ය. **1 රාජාවලිය 22:40** අපට පෙන්වන්නේ යෙහොෂාපාත් රජවන විට ආහබ් රජවී අවුරුදු හතරක් ගෙවී තිබූ බවය. එම පරිච්ඡේදයේ 43 පදය අනුව " ඔහු තමාගේ පියාවූ ආසාගේ මුළු මාර්ග යෙහි හැසිරෙමින්, එයින් අහක් නොවී, ස්වාමීන්වහන්සේගේ ඇස්හමුයෙහි හරිව තිබුණු දේ කළේය". මේ නිසාම යුද ට සවිලදායක යුගයක් උදාකළ රජෙක් පිහිටුවනු ලැබිණ. දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි හැසිරෙන ඕනෑම කෙනෙකුට **යොහාන් 14:6** ඉතා වැදගත් වනු ඇත. **"මාර්ගයද සැබෑවද ජීවනයද මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට යන්නේ නැතැයි"** යේසුස්වහන්සේ කීසේක. යේසුස්වහන්සේ තුළ අදහාගන්නා ස්වාමීන්වහන්සේගේ ඇස්හමුයෙහි හරිවූදේ කරයි. ආසාගේ කාලයේ ඉතිරිව සිටි සමලිංගිකයන් විනාශ කිරීමට යෙහෝෂාපාත් ක්‍රියාකළ බව **1 රාජාවලිය 22:46** දක්වයි. මෙම කැත කිළිටි පාපය වරදක් නොවේයයි හඟවමින් ලාබාලයින් ඊට බිලිකරගන්නා නීච තෘෂ්ණා සපුරන්නන්ට "ඒඩ්ස්" නම් මාරාන්තික රෝගය වැළදීමට සැලසීමෙන් දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ උදහස එළිදරව් කර තිබේ. මේ පාපයට ගිජු වූවන් බලුකම්කරන්නන් ලෙසද දක්වා තිබේ. (**ද්විතීය 23:18**) "බයිබලයේ සතුන්" පොතෙහි බල්ලා පිළිබඳ ලිපියෙහි මෙය ඔබටම කියවා ගත හැක. **රෝම 1:26 හා 27 ලෙවි කථාව 20:13** ද බලන්න. සමලිංගිකයා අධමයෙකි. මානසික රෝගියෙකි. විකෘති කාමුකයෙකි. එබන්දන් දේශයෙන් ඉවත් කළ යහපත් යෙහෝෂාපාත්!

## <u>දේව වචනය පතල වෙයි.</u>

යෙහෝෂාපාත් ස්වකීය රාජ්‍ය පාලනයේදී ස්වාමීන්වහන්සේගේ ව්‍යවස්ථාව යුදා නුවරවල ප්‍රචලිත කිරීමට බොහෝ වෙහෙසදැරීය. ඔහු තමාගේ තුන්වන පාලන වසරේදී ස්වකීය ආධිපතීන්වූ බෙන්හයින්, ඔබදියා, ශෙකරියා, නෙතනේල්, මීකායාද, ලෙවි වරුන්වූ ෂෙමායා, නෙතනියා, ශෙබදියා, අසාහෙල්, ෂෙමීරාමොත්, යොහෝනාතාන්, අදෝනියා, තෝබියා, ටෝබීයා අදොනියාද, පූජක මෙහෙය උදෙසා එලීසාමා හා යෙහෝරාම්ද මේ සේවයට යෙදවිය. ශුභාරංචිය ප්‍රකාශකිරීම සඳහා ඔබ යම් ප්‍රයත්නයක් (කාලය දීමෙන්, ශ්‍රමයෙන් හෝ මුදලින්) දරයි නම් යෙහෝෂාපාත්ගේ උනන්දු සේවයටත් වඩා එය ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් වනු ඇත. යේසුස් ස්වාමීන්වහන්සේ උදෙසාත් ඔබ කැපකර ඇත්තේ කුමක්ද?

**"ස්වාමීන්වහන්සේ යෙහෝෂාපාත් සමඟ සිටිනසේක" (2 ලේකම් 17:3).**

**"එබැවින් ස්වාමීන්වහන්සේ රාජ්‍යය ඔහු අතේ ස්ථිර කළසේක. සියලු යුදාවරු යෙහෝෂාපාත්ට තෑගි ගෙනාවෝය. වස්තුවද, ගෞරවයද බොහෝසෙයින් ඔහුට තිබුණේය. ඔහුගේ සිතද ස්වාමීන්වහන්සේගේ මාර්ගවල ධෛර්යවත්වී නැවත ඔහු යුදා රටින් උස්තැන්ද අෂේරාකණුද පහ කෙරුවේය" (2 ලේකම් 17:5-6)**

යොහෝෂාපාත්ගේ පුත්‍රයන් අසරියා, යෙහියෙල්, සෙකරියා, අසරියා (2) මීකා ෂෙපාටිය හා යෙහෝරාම් බව **2 ලේකම් 21:2** දක්වයි. යෙහෝරාම් කුළුඳුලා බැවින් ඔහු රාජ්‍යයට හිමිකම් කීවේය. යෙහෝෂාපාත් කළ වරද අතර ඔහු ඊශ්‍රායෙල් රජවූ දුෂ්ඨ ආහබ් සමඟ මිත්‍රකම් බැඳීම හා ඔහු සමඟ සිරියවරුන්ට විරුද්ධව යුද්ධයට යාමද අහසියා රජු සමඟ එකතුව තර්ෂිෂ්ට යාමට නැව් සෑදීමද දැක්විය හැක. එම නැව් බිඳී ගොස් උත්සාහය ව්‍යර්ථ විය.

**- ප්‍රැන්සිස් විජයසිංහ -**

# ක්‍රිස්තියානි ජීවිතයේ වැදගත් අත්තිවාරම් 12 ක්.

01. **දෙවියන්වහන්සේගේ ජීවනය** - යොහාන් 3:5 (දෙවියන්වහන්සේගේ වචනය හා ආත්මයාණන් කරණකොට ගෙන නැවත ඉපදීම ලබා ගැනීම)

02. **දෙවියන්වහන්සේගේ වචනය** - 2 තිමෝති 3:15-16 (නිතිපතා බයිබලය කියවීම, පරිහරණය හා පරිශීලනය කිරීම)

03. **දෙවියන්වහන්සේගේ ආත්මයාණෝ** - රෝම 8:9 (ශුද්ධාත්මයාණන්ට ජීවිතයේ ක්‍රියා කිරීමට ඉඩ දීම)

04. **දෙවියන්වහන්සේගේ අනුග්‍රහය** - හෙබ්‍රෙව් 12:28 (එනම් දෙවියන්වහන්සේගේ කරුණාව, ප්‍රේමය, විශ්වාස කිරීම හා ඒ මත යැපීම)

★ අනුග්‍රහයෙන් ගැලවීම ලැබීම - එපීස 2:8
★ සේවය කිරීමට, දරාගැනීමට, පීඩාකමේදී දෙන අනුග්‍රහය - 2 කොරින්ති 12:9

05. **දෙවියන්වහන්සේගේ ගෘහය** - ගීතාවලිය 26:8 එනම් සභාවට අයත් වීම හා එහි සභාකම් පැවැත්වීම.

★ අපි උන්වහන්සේගේ ගෘහය - හෙබ්‍රෙව් 3:6
★ අපි ආත්මික ගෘහය - 1 පේත්‍රුස් 2:5
★ ජීවමාන දෙවියන්වහන්සේගේ සභාව - 1 තිමෝති 3:15
★ දෙවියන්වහන්සේගේ වාසය පිණිස .... - එපීස 2:22

06. **දෙවියන්වහන්සේගේ යුධායුධ** - එපීස 6:11-13 (සැබෑකම, ධර්මිෂ්ඨකම, සුභාරංචිය ප්‍රකාශ කිරීම, ඇදහිල්ල, ගැලවීම තුල ජීවත්වීම දේවවචනය පරිහරණය කිරීම යන ගුණාංග සහිතව ජීවත් වීම)

07. **දෙවියන්වහන්සේගේ කැමැත්ත** - එපීස 5:17 (තම ජීවිතය දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා දැනගෙන ඒ අනුව ජීවත් වීම)

08. **දෙවියන්වහන්සේගේ බලය** - එපීස 1:19 / 6:10 (යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ බලය තම ජීවිතයට අදාල කර ගැනීම)

09. **දෙවියන්වහන්සේගේ ප්‍රේමය** - එපීස 3:19 (දෙවියන්වහන්සේගේ ප්‍රේමය විශ්වාස කිරීම හා ප්‍රේමවන්ත ජීවිතයක් ගත කිරීම)

10. **දෙවියන්වහන්සේගේ කැඳවීම** - පිලිප්පි 3:17 (දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීම තේරුම් ගැනීම හා ඊට ඔබින ලෙස ජීවත් වීම)

11. **දෙවියන්වහන්සේගේ අභිප්‍රාය** - 2 තිමෝති 1:9 (තම ජීවිතයේ දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් තේරුම් ගැනීම හා ඒ උදෙසා ජීවත් වීම)

★ ක්‍රිස්තුස්වහන්සේගේ උරුමයක් බවට පත්වීම - එපීස 1:11-12
★ පුත්‍රයන්ගේ ස්වරූපයට සමාන කිරීම. - රෝම 8:28-29
★ යක්ෂයාට හා දූතයන්ට අප කරණකොට ගෙන දෙවියන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව පෙන්වන පිණිස - එපීස 3:10-11
★ දෙවියන්වහන්සේ අප අතරේ වාසය පිණිස - එළිදරව් 21:3
★ සියල්ල ඒකරාශී කිරීමට - එපීස 1:9

12. **දෙවියන්වහ්සේගේ මහිමය (ගෞරවය)** - පිලිප්පි 1:20 (අපගේ ජීවිතයෙන් දෙවියන්වහන්සේට ගෞරව කිරීම)

**- බයිබල් අධ්‍යනයක් ඇසුරිනි -**

# යෝනා සහ අද

## (යෝනා පොත සම්පූර්ණයෙන්ම කියවන්න)

මහ සයුර මත යාත්‍රා කරන නැවකින් මුහුදට විසිකරනු ලැබූ මිනිසෙක් ජල දහරා අතරින් පතුලට කිඳී යයි. ඔහුගේ හිස වටා මුහුදු පන් එතී යයි. ජීවිතය පිළිබඳ බලාපොරොත්තුවක් නැති තරම්ය.

මේ මිනිසා මුහුදට හෙලනු ලැබුවේ ඔහුගේම ඉල්ලීම පරිදිය. නැව යාත්‍රා කරමින් තිබියදී හමන්නට වූ ප්‍රචණ්ඩ කුණාටුවෙන් මිදීමට තිබූ එකම පියවරද එය විය. මොහු නම් බයිබලය කියවන කව්රුත් දන්නා යෝනා නැමති මනුෂ්‍යයාය.

දෙවියන්වහන්සේ යෝනාට යම් කාර්යයක් පැවරූ සේක. එනම් නිනිවය නම් නුවරට පණිවිඩයක් රැගෙන යෑමයි. උන්වහන්සේ මෙසේ පැවසූසේක.

**"නුඹ නැගිට නිනිවය නම් මහත් නුවරට ගොස් ඊට විරුද්ධව මොර ගසාපන්න. මක්නිසාද ඔවුන්ගේ දුෂ්ඨකම මා ඉදිරියට පැමිණ තිබේ" (යෝනා 1:2).**

යෝනා මේ පණිවිඩය ගෙන යෑමට අකමැතිව, තර්ෂිෂ් බලා යන නැවකට ගාස්තුව ගෙවා ඊට ගොඩනැගුණේය. යෝනා රැගත් නැවට වැඩිදුරක් යාත්‍රා කිරීමට ලැබුණේ නැත. ස්වාමීන්වහන්සේ මහත් කුණාටුවක් ඇති කළ සේක. මේ වේලාවේ යෝනා නැවේ ඇතුලට බැස නිදාගෙන සිටියේය.

**"යෝනා නැවේ ඇතුළට බැස හාන්සිවී තද නින්දට පැමිණ හුන්නේය" (යෝනා 1:15).**

මෙහි යෝනා යන නම වෙනුවට ඔබේ හෝ මගේ හෝ නමත් ආදර්ශ වීමට ඉඩක් තිබේද? අපත් ස්වාමීන්වහන්සේගේ පණිවිඩය පැත්තකින් තබා, උන්වහන්සේගේ වෙරළින් දියත් වෙන්නාවූ නැවක පතුලේ හාන්සි වී නින්දට වැටී සිටිනවාද? නාවිකයන් අපව අවදි කරවන්නේ නැත. මන්ද අප ගාස්තුව ගෙවා ඇත. එහෙත් ස්වාමීන්වහන්සේගේ පණිවිඩය එසේම ක්‍රියාත්මක විය යුතුව තිබේ. නැතිනම් නිනිවයේ මනුෂ්‍යයෝ පාපයෙහිම විනාශයට පත්වන්නාහ.

ආත්මික නින්දෙන් අප අවදි කරවීමට, ස්වාමීන්වහන්සේගේ වෙරළට නැවත අපව ඇද ගැනීමට උන්වහන්සේ මුහුද කළඹවන සේක. ස්වාමීන්වහන්සේගෙන් අප ඈත්වන විට මෙවැනි සැර කුණාටු අප ජීවිත හමුවට පමුණුවන සේක. අපගේ සේවය අමතක කර, පසුබටව ආත්මික නින්දට වැටී සිටියොත් නිනිවය නුවරට කුමක් සිදුවේද? අද නිනිවය නම් (ආත්මික වශයෙන්) පාපයේ ජීවත්වන ජන සමූහයන්ය. දුෂ්ඨ කමෙහිම ඔව්හු විනාශවෙමින් සිටින්නාහ. ඒ අය සඳහා ගැළවීමේ පණිවිඩය අප අතෙහිය. ස්වාමීන්වහන්සේ අපට භාරදුන් මෙහෙය පසෙක ලා අප නැවේ ඇතුලට බැස නිදාසිටිමුද?

මුහුදේ කුණාටුව නැතිවීමට නම් යෝනා මුහුදට හෙළීම අවශ්‍ය බව නැවියෝ තේරුම් ගත්හ. මන්ද

යෝනා සිද්ධිය ප්‍රකාශ කළ අතර තමාව මුහුදේ හෙලන්නැයි ද කියා සිටියේය. මේ සියල්ල මෙසේ සිදුවූයේ දෙවියන්වහන්සේගේ සැලසුම් කිරීමට අනුවමය. කැළඹෙන මුහුදේ දිය රළ අතරෙහි යෝනා ගිලියද්දී කුණාටුව නතරවෙයි. ඔහු මුහුදු පතුලට කිඳා බසින කළ ස්වාමින්වහන්සේ ඔහුව ගිලගැනීමට මත්ස්‍යයෙකු පත්කළ සේක. ජල දහරා අතරෙහි ඔහුට දෙවිසමිඳුන් අයැදීම අපහසු වූවත් දැන් ඔහුට ඒ සඳහා අවකාශයක් සැලසී ඇත, යෝනා වහාම පසුතැවිල්ලෙන් යාච්ඤාවක් කරයි. (යෝනා 2) ඔහු යාච්ඤා කරන අතර, "ඔබගේ ශුද්ධ මාලිගාව දෙස නැවත බලන්නෙමි" යයි පවසයි.

ස්වාමින්වහන්සේගේ වෙරළින් අපව දුරස් කරන ලෞකිකත්වයේ නෞකාවේ ඇතුළෙහි වැතිර නිදා සිටින අප කටුක අත්දැකීම් අතර කිඳාබසින නමුත් ස්වාමීන්වහන්සේගේ කරුණාව අප අත් නොහරින සේක. එවන් ජලදහරා අතරේම ස්වාමින්වහන්සේ දෙසට හැරීමේ අවකාශයද අපට තිබේ.

"ඔබගේ ශුද්ධ මාලිගාව දෙස නැවත බලන්නෙමි" කියන්නට ..... අවකාශයක් ඇත. ඔහු මහා මත්ස්‍යයාගේ කුස තුළ සිටියද තවම සාගරය පතුලේම විය. ස්වාමීන්වහන්සේ ඉදිරියේ යෝනා වරද පිළිගෙන නැවත හැරුණු විට උන්වහන්සේ ඔහුව ගොඩට ගෙනැවිත් වැමෑරීමට මාළුවාට අණ කළසේක. නැවතත් අපි ස්වාමින්වහන්සේගේ වෙරළට පැමිණ සිටිමු. කුණාටුව තුළින්, මහත් ජල දහරා තුළින්, මත්ස්‍යාගේ කුසින්, යලිත් ගැලවීමේ වාරයට -

දෙවන වරත් ස්වාමීන්වහන්සේගේ පණිවිඩය යෝනා වෙත පැමිණ, **"නුඹ නැගිට නිනිවය නම් මහත් නුවරට ගොස් මා විසින් නුඹට කියන කාරණ එහි ප්‍රකාශ කරපන්න" (යෝනා 3:1).**

පළමු වතාවේ යෝනා මේ වචන වලට කීකරු වුණා නම් ඔහු ඉහත කී කටුක අත්දැකීම් තුළින් ගමන් කරන්නේ නැත. නිනිවය නගරය විශාල එකක් විය. එහි ජනතාව කෙරෙහි, ඔවුන් දුෂ්ඨව සිටියද, ස්වාමීන්වහන්සේගේ සිතෙහි වූ අනුකම්පාව එතුමන්ගේම වචන වලින් මෙසේය.

"එක් ලක්‍ෂ විසි දහසකට වඩා මනුෂ්‍යයන්ද, මෘගයන්ද සිටින්නාවූ නිනිවය නම් වූ මහත් නුවර කෙරෙහි මාත් අනුකම්පා කළ යුතු නොවේද?" යෝනා මගින් දේව පණිවිඩය ඇසූ නිනිවයේ සෙනග පසුතැවිලිව නිරාහාරව යාච්ඤාවේ යෙදුන අතර තම වරද වලින් හැරුණෝය. එම දේශය ආරක්‍ෂා විය.

යම් දේශයක දුෂ්ඨකම බහුල වෙන විට, (යෝනා 4:11) රූප වන්දනාව පැතිරෙන විට එම දේශයට ස්වාමීන්වහන්සේගේ උදහස යොමුවේ. නොයෙකුත් විපත් ආපදාවන්ට දේශය මුහුණපායි. ස්වාමීන්වහන්සේ මෙසේ සිදු කරන්නේ සෙනඟට පාපයෙන් හැරීමට බොහෝ කල්දීමෙන් පසුවයි. එහෙත් අවංකව ස්වාමීන්වහන්සේව අදහන අයම උන්වහන්සේ එවන් විපත්ති සමයන්හි ආරක්‍ෂා කරන බව පැහැදිලිය. මුල් කාලයේ මිනිසාගේ දුෂ්ඨකම වැඩිවූ අතර, ඔවුහු ස්වාමීන්වහන්සේ නෝවා තුළින් කළ අවවාද ගණනකට නොගත්හ. එහිදී නෝවාත්, පවුලේ අයත් හැර මුළු පොළවම ජලගැල්මෙන් විනාශවිය.



සොදොම් - ගොමෝරා නගර ඇදහිලිවන්තයින් අඩුම වශයෙන් දහදෙනෙක්වත් සිටින්නේනම් විනාශ නොකරන බව ස්වාමීන්වහන්සේ වදාළ සේක. එම නගරවලට නපුරු පාපයන් නිසා විනිශ්චය ළඟාවීමට තිබුණි. දසදෙනෙක්වත් එහි අදහන්නෝ නොවූහ. ලොත් සහ ඔවුන්ගේ පවුලේ අය හැර එම නගර දෙකම ගින්නෙන් විනාශකරනු ලැබීය. ස්වර්ගයට කැඳවා ගැනීම පිණිස මිස නොවේ නම් ඇදහිලිවන්තයෙකු මෙවැනි විනිශ්චයකදී ආරක්‍ෂා කෙරේ.

අද අපේ මේ පුංචි දේශයද මහත් ව්‍යසනයකට පත්ව ඇත. හැම පැත්තෙන්ම විනාශයේ හඬ ඇසේ. මිනිස් ජීවිත අකාලයේ විනාශවී යයි. ස්වාමීන්වහන්සේ මෙසේ වන්නට ඉඩ හැරියේ ඇයි දැයි මනුෂ්‍යයෝ ප්‍රශ්න කරත්.

ලංකාවේ මෑත යුගයකදී දුෂ්ඨකම අතිශයින් වැඩි වූ බව රහසක් නොවේ. සොදොම ගොමෝරා විනාශයට හේතුවූ අන්දමේ බලවත් පාප අප රටෙහිද වැඩි වී ඇති බව නොරහසකි. ලංකාව තුළ මේ විපත්ති වලට හේතුව පාපයේ බහුලත්වයම විය හැකිය. මෙවන් අවස්ථාවක අපි තර්ශිෂ්ට යන නැවට ඇතුල්වී යෝනා සමඟ නිදාසිටිමුද? ලංකාව පුරා පැතිරියන විනාශයන් මධ්‍යයේ අප නැවත ස්වාමීන්වහන්සේගේ මාලිගාව වෙත හැරෙමු. අපගේ පසුබටවීම්, අකීකරුවීම්, නිදිබර අලසකම්, ශුභාරංචිය දීමේ අත පසුකිරීම් ඒත්තු ගනිමු. ලක්වැසිය න්ගේ පාපයේ භයානකකම මෙන්ම, ඇදහිලිවන්තයාගේ ආත්මික නින්ද නිසාද මේ විනාශයන්ට උන්වහන්සේ ඉඩහැරියා විය හැකිය. කෙසේ වෙතත් දැන්වත් (එපීස 6:10-18) ඇදහිලිවන්තයාගේ යුද්ධායුධ පැළඳ සූදානම්ව සිටිමු.

සතුරා පිටුපස නිතරම සිටින්නේ සාතන් බව අපි දනිමු. අප රටේ ශුභාරංචියේ නිදහස නැති කර, ආඥාදායකත්වයේ පාලනයක් ගොඩනැගීමට මනුෂ්‍යාව පොලොඹවන්නේ සාතන් බවද අපි දනිමු. එහෙත් යේසුස්වහන්සේට සවන් දෙන්න.

**"බලව සර්පයන්ද ගෝනුස්සන්ද පාගන්ටත්, සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලයදී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය" (ලූක් 10:19).**

අපි ඇදහිල්ලෙන් මේ බලය පාවිච්චි කරමු. ඇදහිලිවන්ත සෙනඟ සභාවක් වශයෙන්, පවුලක් වශයෙන්ද කණ්ඩායමක් වශයෙන්ද, පුද්ගලිකවද දේව වචනය නැමැති කඩුවත් ඇදහිල්ලේ පළිහත් ගෙන අනෙකුත් (එපීස 6:10-18) යුද්ධා යුධ ඇතිව යාච්ඤා සටන ගෙන යන අතර දෙවියන්වහන්සේ අපට සුභාරංචිය ප්‍රකාශ කිරීමට හා සේවය කිරීමට නිදහස් වාතාවරණය ආරක්ෂාකර දෙනු ඇත.

**- හොරණෑ හඬ -**

# කිරිඳි උපමාව

පසුගිය කලාපයේ "වපුරන්නාගේ උපමාව" සලකා බැලූ අපි මෙවර මතෙව් 13:24 සිට 30 දක්වා කොටසෙහි අඩංගු "කෙතේ කිරිඳිවල උපමාව" සලකා බලමු මෙම උපමාවට ඉහත කී නම දෙනු ලැබුවේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් විසින්ය. මතෙව් 13:36 හි සඳහන් පරිදි මේ උපමාව ගැන විමසද්දි ඔවුන් ඉල්ලා සිටියේ "කෙතේ කිරිඳිවල උපමාව" අපට පහදා දුන මැනව කියාය. මෙම උපමාවේද අදහස ස්වාමීන්වහන්සේ විසින්ම පවසා තිබෙන බැවින් එය තේරුම් ගැනීම අපහසු නැත.

**"(24) තමාගේ කෙතෙහි හොඳ බීජ වපුල මනුෂ්‍යයෙකුට ස්වර්ග රාජ්‍යය සමාන කරනු ලැබේ. (25) මනුෂ්‍යයන් නිදා සිටියදී ඔහුගේ සතුරා ඇවිත් තිරිඟු අතරෙහි කිරිඳි වපුරා ගියේය. (26) කොළ වැඩි කරල් හටගත් කල කිරිඳිත් පෙනුණේය. (27) එවිට ගෙදර ස්වාමියාගේ දාසයෝ ඇවිත්, ස්වාමීනි, ඔබගේ කෙතෙහි ඔබ හොඳ බීජ වපුලා නොවේද? එසේ වී නම් කිරිදි කොයින්දැයි ඔහුට කීවෝය. (28) සතුරෙක් මේක කරලා තිබේයයි ඔහු කීවේය. එවිට දාසයෝ කථාකොට එසේවී නම් අප ගොස් ඒවා උදුරා දමනවාට ඔබ කැමතිදැයි ඔහුගෙන් ඇසුවෝය. (29) එහෙත් ඔහු උත්තර දෙමින් එසේ නොකරපල්ලා, කිරිඳි උදුරන කල තිරිඟුත් ඒ සමඟ ඉදිරෙන්ට පුළුවන. (30) කපන කාලය දක්වා දෙවගේම එකට වැඩෙන්ට ඇරපල්ලා කපන කාලයේදී පළමුකොට කිරිඳි එකතු කොට දවන පිණිස මිටි බැඳපල්ලා. නුමුත් තිරිඟු මාගේ අටුවෙහි රැස් කරපල්ලා යයි කපන්නන්ට කියන්නෙමි" (මතෙව් 13:24-30).**

මෙහි "කෙත" නම් ලෝකයය, (මතෙව් 13:38) වපුරන ලද්දේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසිනි. (13:37). වපුරන ලද "හොඳ බීජ" නම් යේසුස්වහන්සේව අදහන්නාවූ මනුෂ්‍යයෝය. රාජ්‍යයේ පුත්‍රයෝ නම් මොව්හුය. "කිරිඳි" නම් දෙවියන්වහන්සේගෙන් නොවන යක්‍ෂයාගේ පාලනය යටතේ සිටින මනුෂ්‍යයෝය. නපුරාගේ පුත්‍රයෝ නම් මොහුය, (13:39). කිරිඳි වැපුරූ සතුරා නම් යක්‍ෂයාය. (13:39) අස්වැන්න කපන කාලය නම් ලෝකාන්තිමයය, (13:39).

## <u>නිදාගත් මුරකාරයෝ</u>

මේ උපමාවෙහි ස්වාමියා තමාගේ කෙතෙහි හොඳ බීජ වැපිරීමෙන් පසු එම වැපුරූ බීජ බලා ගැනීමට මනුෂ්‍යයන් පත් කර ගොස් තිබුණු බව අපට පෙනේ. මක්නිසාද සතුරා ඇවිත් කිරිඳි වැපුරුවේ මෙම මනුෂ්‍යයන් නිදා සිටියදීය (13:25). ක්‍රිස්තියානි සභාවට සිදුවූයේද හරියටම මේ දෙයමය. එනම් පළමු ශත වර්ෂයේදී මුල් සභාවන් දේව භයින්ද ශුද්ධකමින්ද ස්වාමීන්වහන්සේ තුළ පැවතුන නමුත් ටික කලකදී සභාවන්හී වගකිවයුත්තෝ හෝ සභාපාලකයන්ගේ නොසැලකිලිමත්කම නිසා යක්‍ෂයාගේ නියෝජිතයෝද ආගමික වේශයෙන් සභාව තුළට

එක්වූහ. මේ ගැන පාවුල්තුමාද එපීසයේ සභාවෙහි සභාපාලකයන්ට මෙසේ අනතුරු හැඟවූයේය. **"මාගේ පිටත්ව යාමෙන් පසු රැළට අනුකම්පා නොකරන රෞද්‍රවූ වෘකයන් නුඹලා අතරට පැමිණෙන බව දනිමි, නුඹලා අතරින්ම මනුෂ්‍යයන් නැඟිට නමුත් පස්සේ යාමට ගෝලයන් ඇදගන්නා පිණිස කාරණ පෙරළා කථා කරනවා ඇත. එබැවින්.... අවදිව සිටපල්ලා" (ක්‍රියා 20:29-31).** මෙම උපමා කථාවේ මනුෂ්‍යයන් කළේ මෙයට විරුද්ධ දෙයයි. එනම් නිදා ගැනීමයි. කිරිඳි වැපිරීමට සතුරාට හැකිවූයේ මේ නිසයි. පුරාණයේ මෙන් අදද ස්වාමීන්වහන්සේගේ පළාත් සභාවල වගකිවයුතු සහෝදරයන් හෝ සභා පාලකයන් අවදිව සෝදිසියෙන් නොසිටිය හොත් ගැලවීම නොලත් පිටත ආගමික රටාවක් පමණක් ඇති මිනිසුන් සභාවට ඇතුල්වී විශාල ආත්මික පාඩු සිදුකරනවා ඇත. ඔවුහු බැලූ බැල්මට දේව භක්තියේ වේෂයක් දරති. එහෙත් ඇතුළතින් ඔව්හු යක්ෂයාගේ දරුවෝය.

## තිරිඟු මෙන් පෙනුණ කිරිඳි

සතුරා කිරිඳි වැපුරූ බව කිසිවෙකු ඒ වේලාවෙහිම දැනගත්තේ නැත. එය සැබෑලෙස එළිදරව් වූයේ කරල් හටගත් විටදීය (13:26). එල සෑදෙන තුරු කිරිඳිත් තිරිඟුත් අතර වැඩි වෙනසක් පෙනුනේ නැත. නමුත් කරල් හටගත් විගසම වෙනස කැපී පෙනුණි. "ගහ ඒකේ එලවලින් හඳුනාගනු ලැබේ" යයි ස්වාමීන්වහන්සේ පවසන ලද වචනයෙහි සත්‍යකම මෙහි අපට පෙනේ. (මතෙව් 12:33) තමා යේසුස්වහන්සේ අදහන්නේයයි පවසන මනුෂ්‍යයෝ අද ඕනෑ පමණ සිටිති. එහෙත් ඔවුන්ගෙන් වැඩි දෙනෙකු "කිරිඳි" බව අපට පෙනෙන්නේ ඔවුන්ගේ ජීවිත එලවලින්. ඇදහිලිවන්තයෙකු තුළ ප්‍රකාශ විය යුතු එල නම් "ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යටහත්කම, විශ්වාසකම, මෘදුකම, පමණදැන, ක්‍රියාකිරීම" (ගලාති 5:22, 23) යන මේවාය. එසේ නොමැතිනම් මොහු අයත්වන්නේ කිරිඳි ගණයටය. එවන් අයට අවසානයේ ගින්න හිමිවන බව ස්වාමීන්වහන්සේ පැවසූ සේක (13:30).

මෙම උපමාකථාව කියවීමේදී අපට වැදගත්වන්නේ එක් ප්‍රශ්නයකි. එනම් "මා කිරිඳිද, තිරිඟුද" යන්නයි. ඔබ ස්වාමීවූ යේසුස්වහන්සේ පුද්ගලිකව අදහාගෙන උන්වහන්සේගේ වචනයට ගරු කරමින් ඇදහිලිවන්ත ජීවිතයක් ගත කරන්නේ නම් හොඳ එල දැරීම පිණිස කෙතේ වපුරන ලද හොඳ බීජයකට ඔබ සමානය. අවසාන දවස ගැනවත් විනිශ්චය ගැනවත් බිය විය යුතු නැත. එහෙත් එසේ නොවේනම් ඔබ කොපමණ ශීලාචාරවූවත්, ආගමිකවූවත්, යහපත්වූවත්, ඔබ අයත්වන්නේ කිරිඳි වලටය.

**- ගුරුහරු -**



# සාක්ෂි දැරීම

ප්‍රිය සහෝදර සහෝදරිය, ඔබ උසාවියට ගොස්, සාක්ෂිකරුවකුව සිට තිබෙනවාද? සාක්ෂිකරුවකුගෙන් බලාපොරොත්තුවන්නේ යම් කිසි සිදුවීමක් ගැන ඔහු හෝ ඇය දන්නා දේ පැවසීමයි. නොදන්නා හෝ නොදුටු දේ පැවසීමෙන් බොරු සාක්ෂිකරුවන්ව දඬුවමට යටත්වෙයි. ඇදහිලිවන්ත ඔබත් සාක්ෂිකරුවෙක්ය. ක්‍රිස්තුස්වහන්සේ ගැන දන්නා දේ සහ උන්වහන්සේ ව පෞද්ගලිකව අදහා ගැනීමේ අත්දැකීම අන්අයට ප්‍රකාශකිරීමෙන් ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිකරුවෙක් බවට ඔබටත් පත් විය හැක. ශුද්ධ බයිබලයේ අලුත් ගිවිසුමෙහි බොහෝ දෙනෙකුට තමන්ගේ ජීවිතයේ සිදුවූ දේ ගැන සාක්ෂි දරන ලෙස යේසුස්වහන්සේ පැවසූ සේක. එලෙසම ප්‍රේරිතයන් තම ජීවිතය සාක්ෂියක් ලෙස පවත්වා ගත්හ.

**යොහාන් 1:40-42** පදවලට අනුව යේසුස්වහන්සේ හමුවූවාට පසු අන්ද්‍රෑ කළ පළමුදෙය නම් තමන්ට මෙසියස්වහන්සේ හමුවූ බව තම සහෝදර පේත්‍රුස්ට ප්‍රකාශ කිරීමයි. මෙය අන්ද්‍රෑගේ සාක්ෂිය වූ අතර, ඒ තුලින් පේත්‍රුස් බලවත් දේව දාසයෙක් විය. එලෙසම **මාර්ක් 5:19** හි සුවපත් වූ මනුෂ්‍යයාට යේසුස්වහන්සේ ප්‍රකාශ කළේ " **නුඹ ගෙදර නුඹේ නෑදෑයන්, මිතුරන් ළඟට ගොස්, ස්වාමින්වහන්සේ නුඹට කොපමණ මහත් දේවල් කළ සේක්ද කියාත් උන්වහන්සේ නුඹට කරුණාකළ හැටිත් ඔවුන්ට දන්වාපන්න"** ලෙසයි. එලෙසම යේසුස්වහන්සේ ස්වර්ගයට නැගීයන්නට පෙර " **මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වද විඳින්නටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්නටත්, යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. නුඹලා මේ දේවලට සාක්ෂිකාරයෝය" (ලූක් 24:46-48)** යයි ගෝලයන්ට පැවසූ සේක. **රෝම 1:16 "මක්නිසාද මම ශුභාරංචිය ගැන ලැජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද ගැලවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය"** ශුභාරංචිය දේශනා කිරීම නිසා පාවුල්තුමාට බොහෝවර සිරගත වීමට සිදුවිය. නමුත් අවස්ථාවක් ලැබුණු හැමවිට තම සාක්ෂිය නිර්භීතව ප්‍රකාශ කිරීමට ඔහු පසුබට නොවීය. අග්‍රිපා රජ සහ පිරිස ඉදිරියේද එතුමා නිර්භයව සාක්ෂි දැරීය. (ක්‍රියා 26:1-29).

වචනයෙන් මෙන්ම තම ජීවිතයෙන්ද සාක්ෂියක් වන්නට පුළුවන් බව ඉහත

සඳහන් විය. යේසුස්වහන්සේගෙන් සුවය ලැබූ අන්ධ මිනිසා දේව ධර්මය පිළිබඳ හසල දැනුමක් තිබූ අයෙකු නොවීය. එහෙත් ඔහු තමන්ට සිදුවූ විපර්යාසය පිළිබඳව සරලව ප්‍රකාශ කළේය. **"මම අන්ධව සිටියෙමි. මට දැන් පෙනීම ඇත්තේය" (යොහාන් 9:25)**. එය ඔහුගේ සාක්ෂියයි. අප තුළ ඇත්තාවූ බලාපොරොත්තුව ගැන අපගෙන් අසන සියල්ලන්ට උත්තර දීම සඳහා අප නිතරම සූදානම්ව සිටිය යුතු බව 1 පේත්‍රුස් 3:15 හි සඳහන් වේ. ප්‍රිය සහෝදර සහෝදරිය, ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිකරුවෙක් වන්නට කැඳවා තිබෙන බව ඔබ දන්නවාද? ඔබගේ ජීවිත පෙරළිය සහ ස්වර්ගික බලාපොරොත්තුව ගැන ඕනෑම අවස්ථාවක ඕනෑම කෙනෙක් ඉදිරියේ ප්‍රකාශ කරන්නට ඔබ සූදානම්ද? මෙලෙස ඔබ ලැජ්ජා නොවිය යුතු ශුභාරංචිය කුමක්ද? **"ලියවිලි ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැම්පත් කරනු ලැබූ බවත් ලියවිලි ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගිටුවනු ලැබූ බවත්ය" (1 කොරින්ති 15:3-4).**

ලෝකයෝ බොහෝදෙනෙක් ශුභාරංචියට ඇහුම්කන් දීමට අකමැතිය. බොහෝ අය වාද විවාද කරති. සමහර අය බයිබලය කිසිදා නොකියවන අතර සභා සහභාගී කමට නොයති. දෙවිපියාණන්ට ඔවුන් උදෙසා කළ හැකි දේ කුමක්දැයි ඔවුන් දැනගන්නවාට ඔබ කැමති නම් ඔබ උදෙසා උන්වහන්සේ කර ඇති දේ කුමක්දැයි ඔවුන්ට දැනගන්නට සලස්වන්න. එය ජීවිත සාක්ෂියයි. " **එලෙසම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබළයි" (මතෙව් 5:16). "වංක වූ හිතුවක්කාරවූ පරම්පරාවක් අතරේ නුඹලා නිදොස්ව, අහිංසකව දෙවියන්වහන්සේගේ නිර්දෝෂ දරුවන්ව සිටින පිණිස කෙඳිරීම්ද විවාදද නැතුව සියල්ල කරපල්ලා. ඔවුන් අතරේ නුඹලා ජීවනයේ වචනය පාමින් ආලෝකවල් මෙන් ලෝකයේ දක්නා ලබන්නහුය" (පිලිප්පි 2:14-15).** මෙසේ සාක්ෂි දැරීම ඔබේ ජීවිතයේ ද වැදගත්ම කොටස බව ඔබ පිළිගන්නෙහිද? ඔබත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිකරුවකු බවට පත්වන්න.

**- බයිබල් අධ්‍යයනයක් ඇසුරෙනි. -**



# යාච්ඤා ඉල්ලීම්.

යාච්ඤාව යනු දෙවියන්වහන්සේට කතා කිරීම යැයි සරලව හැඳින්විය හැක. එහි ප්‍රධාන අංගයක් වන්නේ අපගේ අවශ්‍යතාවයන් දෙවියන්වහන්සේට පැවසීමයි. අප පුද්ගලිකවද, සභාවක් ලෙස රැස්වූ විටද බොහෝ ඉල්ලීම් දෙවියන්වහන්සේට යාච්ඤා කරමු මොහොතක් කල්පනාකාරී වන්න. අප දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්නේ කුමක්දැයි කියා 98% ක්ම භෞතික අවශ්‍යතාවයන් පිළිබඳව අප බොහෝ ඉල්ලීම් උන්වහන්සේ වෙත ගෙන එන බව පෙනෙයි. එහෙත් පාවුල්තුමාගේ යාච්ඤා ජීවිතය දෙස බැලීමේදී ඔහු සභාව (ඇදහිලිවන්තයන්) පිළිබඳ යාච්ඤා කලේ වෙනත්ම ආකාරයකටයි. අපි ඒ දෙස බලමු. **(එපීස 1:15), (කොලොස්සි 1:9)**

01. ප්‍රඥාවේ හා එළිදරව් කිරීමේ ආත්මය නුඹලාට දෙන පිණිස. - **(එපීස 1:17)**

02. කැඳවීමේ බලාපොරොත්තු දැනගන්න පිණිස. - **(එපීස 1:18)**

03. ශුද්ධවන්තයන්ට ක්‍රිස්තුස්වහන්සේගෙන් උරුමයේ සම්පත කුමක්ද කියා දැනගන්නා පිණිස. - **(එපීස 1:18)**

04. ඇදහිලිවන්තයන්ට සතු දෙවියන්වහන්සේගේ බලයේ මහත්කම දැන ගන්නා පිණිස - **(එපීස 1:19)**

05. සියලු ආකාර ප්‍රඥාව ලබන පිණිස - **(කොලොස්සි 1:9)**

06. ආත්මික නුවණ ලබන පිණිස - **(කොලොස්සි 1:9)**

07. දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමෙන් පූර්ණ වන පිණිස. - **(එපීස 1:9)**

08. සියලු යහපත් ක්‍රියා වැඩි වැඩියෙන් කරන පිණිස. - **(කොලොස්සි 1:10)**

09. දෙවියන්වහන්සේ පිළිබඳ දැනගැන්ම වර්ධනය වන පිණිස. - **(කොලොස්සි 1:10)**

10. ප්‍රීතිය ඇතුව සිටින පිණිස. **(කොලොස්සි 1:11)**

11. ඇදහිල්ල ස්ථිර වන පිණිස. **(කොලොස්සි 1:11)**

12. ඉවසිලිවන්තකම වැඩි වන පිණිස. - **(කොලොස්සි 1:11)**

13. දෙවියන්වහන්සේගේ බලයෙන් ශක්තිමත් වන පිණිස. **(කොලොස්සි 1:11)**

14. නමස්කාරය, ප්‍රශංසාව, හා ස්තුතිය දෙවියන්වහන්සේට වඩ වඩා ඔවුන් කරන පිණිස. **(කොලොස්සි 1:12)**

15. දෙවියන්වහන්සේට ඔබින ලෙස හැසිරෙන පිණිස. **(කොලොස්සි 1:12)**

ඉහත කරුණු දෙස බැලීමේදී අපට තේරුම් යන්නේ වඩාත් උනන්දුවෙන් අප සභාවල ආත්මික වර්ධන හා ගුණාංග වර්ධනය පිළිබඳ යාච්ඤා කළ යුතු බවයි. අපිත් පාවුල්තුමාගේ ආදර්ශය ලෙස අපගේ ඉල්ලීම් දෙවියන්වහන්සේ වෙතට ගෙනෙමු.

**- ජීවන හඬ -**

# සුවඳ පතුරුවන ජීවිතය

අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේව අදහා ගෙන සිටින සෑම දෙනම උන්වහන්සේට අයිතිව සිටියි. ඇදහිලිවන්තයන් වන අපි උන්වහන්සේ තුළ සුවඳ පතුරුවන ජීවිතයක් ගත කළ යුතුයි.

## සුවඳ පතුරුවන ජීවිතය.

**සාලමොන්ගේ ගීතිකා 4:12 - "මාගේ සහෝදරී, මාගේ මනමාලී, වැටකින් වට කළ උයනක්ය, වසා තිබෙන ළිඳක්ය, මුද්‍රා කර තිබෙන උල්පතක්ය".**

ස්වාමීවූ යේසුස්වහන්සේගේ මරණය තුළින් ගැළවීම ලබා නැවත ඉපදීම ලැබුවාවූ අප කෙරෙහි උන්වහන්සේගේ සැලසුම ඉතා අනර්ඝය. අප මවු කුස තුළ පිළිසිඳෙන්නටත් පෙර දෙවියන්වහන්සේ අපව උන්වහන්සේ වෙතට තොරාගෙන තිබේ. අපව මුද්‍රා කර තිබේ (එපීස 1:14). සොයා දැන ගත නොහැකි මහත් ප්‍රේමයකින් උන්වහන්සේ අපට ප්‍රේම කරයි (එපීස 3:18).

මෙවැනි මහත් ප්‍රේමයකින්, කරුණාවකින් වටව සිටින අපගේ ජීවිතය නැමති උයනට උන්වහන්සේ පැමිණි විට අප තුළින් උන්වහන්සේ දකින්නට ආශාවන දේවල් නම්: ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය හා ඉවසිලිවන්තකම යන මේවාය. (ගලාති 5:22).

**අප උන්වහන්සේගේ මහිමය උදෙසා එල දරන්නේ කෙසේද?**

- ★ එකිනෙකාට ප්‍රේම කිරීම තුළින් (1 පේත්‍රුස් 4:8)
- ★ එකිනෙකාට සේවය කිරීම මගින් (1 පේත්‍රුස් 4:10)
- ★ එකිනෙකා ශක්තිමත් කිරීම තුළින්.

**සාලමොන්ගේ ගීතිකා 4:16 - "එම්බා, උතුරු හුළඟ, පිබිදියන්න, දකුණු හුළඟ, වරෙන්න; මාගේ උයනේ සුවඳ විහිද යන පිණිස ඊට හමාපල්ලා. මාගේ ප්‍රේමවන්තයා තමාගේ උයනට ඇවිත් තමාගේ අනර්ඝ එල කෑවාවේ".**

(මාර්ක් 14:3) ට අනුව මරියා ගෙනාවාවූ සුවඳ ද්‍රව්‍ය (ජටාමාංශ) මෙම තෙල මිලෙන් අධික වූ නිසා එතැන සිටි අයගේ දෝෂ දර්ශනයට ඇය ලක් වුනා. නමුත් ස්වාමීවූ යේසුස්වහන්සේ පවසන්නේ ඈ මට යහපත් ක්‍රියාවක් කළ බවයි.

අපට ස්වාමීන්වහන්සේ තුළ කළ හැකි දේ මොනවාද? අපගේ මුල ස්වාමීන්වහන්සේ තුළ කොපමණ ගැඹුරුද? යන්න සිතා බැලීම සුදුසුයි.

## උතුරු සුළඟ

සාලමොන්ගේ 4:16 - එම්බා උතුරු සුළඟ පිබිදියන්න. උතුරු සුළඟ මගින් අපට කියාපාන්නේ ස්වාමීන්වහන්සේ අපව පරීක්ෂා කාලයක් තුළින් ගෙන යන ආකාරයයි. මෙයට හොඳම උදාහරණය ලෙස ගත හැක්කේ. බයිබලයේ යෝබ්ගේ කථාවයි. යෝබ් ඉතා ධනවත් මනුෂ්‍යයෙක් විය. නමුත් ඔහුගේ ජීවිත ගමන අතර තුරදී මහත් අවාසනාවන්ත සිද්ධීන් සමුදායකට මුහුණ පෑමට ඔහුට සිදු විය. එහෙත් අවසානය දක්වාම ඔහු ස්වාමීන්වහන්සේට විශ්වාසවන්තව සිටි බැවින් මුලට වඩා අවසානය ඔහුගේ ජීවිතයේ ආශිර්වාද ලත් එකක් බවට පත්විය. ස්වාමීන්වහන්සේ ඔහුට දෙගුණයක් ආශිර්වාද කළ සේක. (යෝබ් 42:10).

අප ජීවත් වන මේ සමාජය තුළ විවිධාකාර පරීක්ෂාවන් වලට මුහුණ දීමට අපට ද අවසානය තෙක් ඉවසිලිවන්තව, විශ්වාසවන්තව සිටීම තුළින් සියල්ල ජයගත හැකිය. එමගින් උතුරු හුළඟ ජයගෙන ස්වාමීන්වහන්සේගේ ප්‍රේමයේ හුළඟ අපේ ජීවිත තුළින් සුවඳ විහිදුවමින් ගලා යාම ලෝකයා දැකිය යුතුයි. අපත් ස්වාමීන්වහන්සේගේ නාමයේ ගෞරවය උදෙසා සුවඳ හමන උයනක් මෙන් වෙමු. ස්වාමීන්වහන්සේ නැවත පැමිණෙන විට අපි එල දරණ, සුවඳ හමන අය මෙන් සිටිමු.

**- තබීතා -**

# අපි කිතුණුවෝ, හැසිරෙමුද කෙසේ?

**"තමන්වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත් නුඹලා කැඳවනු ලැබූ දෙවියන්වහන්සේට ඔබින ලෙස නුඹලා හැසිරෙන හැටියට ...." (1 තෙසලෝනික 2:11).**

1. ජීවනයේ අළුත් කමින් හැසිරීම - රෝම 6:4
2. ඇදහිල්ලෙන් හැසිරීම. - 2 කොරින්ති 5:7
3. ආත්මයාණන්වහන්සේ කරණකොට ගෙන හැසිරීම. - ගලාති 5:16
4. ප්‍රේමයෙන් හැසිරීම - එපීස 5:2
5. ආලෝකයෙහි හැසිරීම - 1 යොහාන් 1:7

අද එතැන් සිට....

## 6. යහපත් ක්‍රියාවන්හි හැසිරීම - එපීස 2:10

**"අපි වනාහී යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මවනු ලැබ දෙවියන්වහන්සේගේ කර්මාන්තයව සිටිමුව. ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින් සූදානම් කළ සේක" (එපීස 2:10).**

ඇදහිලිවන්ත අප ගැලවීම ලබා සිටින්නේ අපගේ යහපත් ක්‍රියාවල ආනිසංශයෙන් නොවන බව අපි දැනගත යුතුවෙමු. දෙවියන්වහන්සේ අප පිළිගන්නේඅපගේ චරිතය උන්වහන්සේට අනුමත කළ හැකි මට්ටමකට දියුණු වීම නිසා නොවේ. එපීස 2:9 හි සඳහන් හැටියට "කිසිවෙක් පාරට්ටු කර නොගන්නා පිණිස ඒක ක්‍රියාවලියක් නොවේ". අප ගැලවීම ලබාගත්තේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කරණ කොටගෙනයි. අප කළේ අපගේ පාප ගැන පසුතැවිලි වී යේසුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් ලෙස අදහාගැනීමයි.

**"ඇදහිල්ල කරණකොට ගෙන ඒ ඇදහිල්ලේ නුඹලා ගැලවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය" (එපීස 2:8).** එහෙත් අප ගැලවීම ලැබුවායින් පසු ජීවත් විය යුතු ආකාරය ගැන එපීස 2:10 හි සඳහන්ව ඇත. එම දේව වචන වලට අනුව, අප "දෙවියන්වහන්සේ කලින් සූදානම් කර ඇති යහපත් ක්‍රියාවල හැසිරිය යුතුය". යේසුස්වහන්සේ පැවසූ වචන මෙහිදී සිහිපත් කරමු. **"මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ග යෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා" !**

ඇදහිලිවන්ත අපි යහපත් ක්‍රියාවන්හී නිරත විය යුතු බව ඉතා පැහැදිලිය. එහෙත් ඒවා දෙවියන්වහන්සේ විසින් කලින් සූදානම් කරන ලද ඒවා වීමත් අවශ්‍යය. මෙයින් අදහස් කරන්නේ කුමක්ද? අප කළ යුත්තේ අපට කැමති අයුරින් කරන යහපත් ක්‍රියා නොවේ. දෙවියන්වහන්සේ විසින් අප උදෙසා සැලසුම් කර ඇති යහපත් ක්‍රියාය. අපගේ සෑම ක්‍රියාවක් ගැනම අපි දෙවියන්වහන්සේගෙන් විමසිය යුතු වෙමු. අප ලොවට ආලෝකයක් වන්නේ ඒ ආකාරයටයි. මෙහිදී වැදගත් වනුයේ අප දෙවියන්වහන්සේ හා සමඟ ඉතා සමීප සම්බන්ධතාවයක් පවත්වා ගැනීමයි. එසේ නොමැතිව උන්වහන්සේ කලින් සූදානම් කළ යහපත් ක්‍රියාවල යෙදීමට නොහැකිය. ඉන්දියාවේ විසූ බලවත් දේව දාසයකු වන බක්ත් සිං සහෝදරයා පවසන ආකාරයට යාචකයකුට රුපියල් 5ක් දීමට ප්‍රථමයෙන් පවා අප දෙවියන්වහන්සේගෙන් විමසිය යුතු බවයි. එහෙත් එය අපගේ මසුරුකමට වැස්මක් කර නොගත යුතුය. අප නිතර ත්‍යාගශීලී විය යුතුය. පරිත්‍යාග ශීලී විය යුතුය. එහෙත් ඊටත් වඩා අප දෙවියන්වහන්සේට සංවේදීව සිටිය යුතුය. ඇදහිලිවතුන් අතරේ අපහට නිරත විය හැකි ක්‍රියා බොහෝමයකි. තවත් ඇදහිලිවන්තෙකු බැහැදැකීමට යාමේ

පටන් ද්‍රව්‍යමය උපකාර, මුදල්මය උපකාර, ශ්‍රමයෙන් උපකාර හා වචනයෙන් උපකාර දක්වා සෑම අයුරින්ම අන් ඇදහිලිවතුනට යහපත් ක්‍රියාවෙන් සේවය කිරීමට සිහියේ තබා ගනිමු.

තීතස් 1:16, 2:7, 2:14, 3:1, 3:8, සහ 3:14 යන ශුද්ධ ලියැවිලි පද කියවා යහපත් ක්‍රියාවන්හී හැසිරීම පිළිබඳ බොහෝ දේ ඉගෙන ගන්න.

## 07. ප්‍රවේසමෙන් හැසිරීම. - එපීස 5:15.

**"ඒ නිසා නුඹලා ඥානය නැත්තන් මෙන් නොව ඥානවන්තයන් මෙන් ප්‍රවේසමෙන් හැසිරෙන්ට බලාගෙන දවස් නපුරු බැවින් ප්‍රස්තාව අල්ලාගනිල්ලා" (එපීස 5:15).**

අප කිතුණු ඇදහිලිවතුන් බවට පත් වූ වහාම අප ස්වර්ගයේ පුරවැසියන් බවට පත්වේ. දැන් අපි මේ ලෝකයට අයත් තැනැත්තන් නොවෙමු. මේ නිසා අප ජීවත් විය යුත්තේ තම මව්රටින් පිටත් වී විදේශීව ජීවත් වන මිනිසුන් ලෙසින්ය. මෙලොවේ ඇති අනේක විවිධ අනතුරු පිළිබඳ අපි දැනුවත්ව ප්‍රවේසම් විය යුතු වෙමු. මේ අනතුරු ශරීරික ඒවා නොව අපගේ ආත්මික ජීවිතයට ඇති අනතුරුය.

අප මුහුණ දිය යුතු සතුරන් තුන්දෙනෙක් පිළිබඳ ශු.බයිබලය අපට උගන්වයි. ලෝකය, මාංශය සහ යක්ෂයා එම සතුරන් තිදෙනාය. ලෝකය නිතර උත්සහ කරන්නේ එහි බලපෑමට අනුව අපව හැඩගැස්වීමටයි. ලෝකයා දෙවියන්වහන්සේට පළමු තැන දෙන්නේ නැත. එහෙත් අප සියලු කාරණා වලදී උන්වහන්සේට පළමු තැන දෙමු. අපගේ මාංශය නම් පාපකාරී ජම්මික සිතය. එය නිතර අපගේ ආත්මික ජීවිතයට බාධා කරයි. මාංශික පාපය නම් කෑදර කම, කම්මැලිකම, තෘෂ්ණාව, වාචාලකම, වැනි දෑය. අප ක්‍රිස්තුස්වහන්සේ සමග මරණයට පත්වී ඇති බව විශ්වාස කළ යුතු වෙමු. අපගේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමග කුරුසියෙහි ඇණගැසනු ලැබ තිබේ. මාංශික පාප වලට ඉඩ නොදීමට අප ප්‍රවේසම් විය යුතු වෙමු. යක්ෂයා නිතර අප පාපයට ඇද දැමීමට කුරුමානම් අල්ලයි.

1 පේතෘස් 5:8 හී සඳහන් පරිදි, කවරෙකු ගිලිම්දෝයි සොයමින් යක්ෂයා ඔබ මොබ ඇවිදිමින් සිටියි. අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ ඉදිරියට පරීක්ෂා ගෙන ආ ලෙසම යක්ෂයා අප ඉදිරියටත් පරීක්ෂා ගෙන එයි. යේසුස්වහන්සේ මෙන්ම අපත් යක්ෂයාගේ සියලු යෝජනාවලට විරුද්ධව සිටිය යුතුය. අපගේ ආත්මික ජීවිතය විනාශ කිරීමට යක්ෂයා බොහෝ උගුල් අටවන්නේය. යම් ආකර්ශණීය පුද්ගලයන් තුලින් අපගේ ජීවිතය වැරදිමඟට යොමු කරන්නට ඔහු උත්සාහ දරනු ඇත. අප ප්‍රවේසමෙන් හැසිරිය යුතුයැයි පැවසෙන්නේ මේ නිසයි.

## 08. කැඳවනු ලැබූ කැඳවීමට ඔබිනා ලෙස හැසිරීම - එපීස 4:1

**"කැඳවනු ලැබූ කැඳවීමට ඔබින ලෙස, සියලු ආකාර යටත්කමින්ද මොළොක් ගුණයෙන්ද ඉවසිලිවන්ත කමෙන්ද හැසිර...." (එපීස 4:1)**

වැඩි පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවන තරමට ඉහත ශුද්ධ ලියැවිලි පාඨය සරලව තිබේ. දෙවියන්වහන්සේ අප කැඳවා තිබෙන කැඳවීමට ඔබින ලෙස හැසිරෙනවා යනු යටත්කම, මොළොක් ගුණය, හා ඉවසිලිවන්තකම ඇතුව හැසිරීමය. අපගේ පුද්ගලික ජීවිතය ගැන මඳක් සිතා බලන්න. කොහොමද ඔබගේ යටත්කම? ඔබ මොළොක් ගුණයෙන් යුක්තව කටයුතු කරනවාද? කොහොමද ඔබගේ ඉවසිලිවන්තකම? මේ ගුණාංග ශුද්ධාත්මයාණන්ගේ ඵල බව මතක් කර ගනිමු. කිතුණු ජීවිතයේ අරටුවේ මේ ගුණාංග ගැබ් වී තිබිය යුතුයි. මේවා නොමැති කිතුණු ජීවිත සැබෑ කිතුණු ජීවිත නොවේ. ඵරිසිවරුන් බයිබලය උගත් අය වුවත් මෙම චරිත ගුණාංග ඔවුන් තුළ තිබුණේ නැත. යේසුස්වහන්සේ ඔවුන් හැඳින්වූයේ සුදුකල සෙහොන් ගෙවල් හැටියටයි. යටත්කම, මොළොක් ගුණය හා ඉවසිලිවන්තකම මොනතරම් අපට අවශ්‍යද!

- මතුසම්බන්ධයි -

**- නෙවිල් ජයසුන්දර -**

# කිළිටි ආත්මයන් ආවේශවූවකු සුවකිරීම.
## (මාර්ක් 1:21-28 බයිබලයෙන් කියවන්න)

| | | |
|---|---|---|
| 01 | කපර්ණවුම යැයි නම් වූ නගරය | ට |
| | යේසුස්වහන්සේ දිනකදී ගමන් කො | ට |
| | සිනගෝගයේ රැස්වී සිටි පිරිසක | ට |
| | ඉගැන් වූ සේක සිත් ගන්නා ලෙස | ට |
| 02 | ලියන්නන් විසින් ඉන් පෙර කරන ල | ද |
| | ඉගැන්වීම් ලෙස නොව බලවතකු ලෙ | ද |
| | එතුමා කල ඉගැන්නුම් ගැන අසන ස | ද |
| | සිටියේ එහි සිටියවුන් පුදුමෙකින් ත | ද |
| 03 | ඒ මොහොතේ අපිරිසිදු වූ ආත්මය | ක් |
| | ආවේශ වූ කෙනෙක් නගමින් මහත් හඬ | ක් |
| | යේසුනි, නාසරෙත් ඔබහට අපෙන් වැඩ | ක් |
| | නෑ ඔබ පැමිණියේ මෙහි හින්දාද කුම | ක් |
| 04 | දන්නෙමි ඔබ තුමාණන් ගැන කවුද | කියා |
| | ඔබ පිරිසිදු තැනය සතුවූ දේව | පියා |
| | කියනා විට අසුද්දවූ ඒ ආත් | මයා |
| | සමිඳු වදාලේ තොප කට ගනුව | පියා |
| 05 | තරවටු කරන විට පිටවී යන ලෙස | ට |
| | මිනිසා වේව්ලුවා ගෝසාවකුත් කො | ට |
| | තවකල් ආවේශ වී මඳකුත් නොසි | ට |
| | පිටවිය යක්ෂයා උවදුරු නිමා කො | ට |
| 06 | මේ අරුමය දුටුව එහි සිටි සියලු | දෙන |
| | උන් උන් කතා කළ සිදුවූ කරුණ | ගැන |
| | බලයෙන් යුතුව යක්කුන් හට කරන | අණ |
| | යේසුස් සමිඳු වෙත නැමුවා උන්ගේ | දණ |
| 07 | සමිඳුන් කරන ලද මේ පෙළහර | පැම |
| | සිදුවිය ගලීලයේ සැමතැන පැති | රීම |
| | එදිනදී සිනගෝගයේ සිටි සැම | ගේම |
| | මෙහෙවර වුනා මේ තොරතුරු ගෙන | යෑම |
| 08 | ආවේසව සිටින යක්කුන් එලවන් | න |
| | එලවා අප සැමට සුබසෙත සලසන් | න |
| | හැකියාවක් තිබෙන සමිඳුන් අදහන් | න |
| | අපගේ සිත් යොමමු ගැලවුම ලැබගන් | න |

- ජේ. ඊ. ජයසුන්දර -
රඹුක්කන

# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්.

## ඉරිදා

පෙ.ව 8.15 - 9.15 - ඉරිදා පාසැල
අවුරුදු 3-18 දක්වා ළමුන් සඳහා

පෙ.ව 9.30 - 12.00 - රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම
(සිංහල , දෙමළ , ඉංග්‍රීසි)

ප.ව 4.00 - 5.00 - සුභාරංචි රැස්වීම - (සිංහල)

ප.ව. 6.00 - 7.00 - සුභාරංචි රැස්වීම - (ඉංග්‍රීසි)

## අඟහරුවාදා

ප.ව 6.30 - 7.30 - සුභාරංචි රැස්වීම
(දෙමළ)

## බදාදා

ප.ව 6.00 - 7.30 - යාච්ඤා රැස්වීම
අසනීප අය සඳහා තෙල් ආලේප කර
යාච්ඤා කිරීම

## සිකුරාදා

ප.ව 6.00 - 7.30 - බයිබල් අධ්‍යයනය


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2581901 / 077 8813197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/A, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com